කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව
විද්‍යා පීඨය
කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය
විශ්වවිද්‍යාල ප්‍රවේශය 2019/2020

<u>යෝග්‍යතා පරීක්ෂණය</u>

<u>කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව</u>

කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ සිව් අවුරුදු ගෞරව උපාධි පාඨමාලාව (MIT) කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය මගින් ආරම්භ කර, මේ වන විට ව්‍යාපාර සහ මෘදුකාංග ඉංජිනේරු ක්ෂේත්‍රයේ ඉතා ඉහළ පිළිගැනීමක් හිමි කරගනිමින් ඉතා සාර්ථකව පවත්වාගෙන යන උපාධි පාඨමාලාවකි. මෙම පාඨමාලාව හැදෑරීම මගින් තොරතුරු තාක්ෂණය **(Information Technology),** තොරතුරු පද්ධති **(Information Systems),** ව්‍යාපාර පද්ධති ඉංජිනේරු විද්‍යාව **(Business Systems Engineering)** සහ මෙහෙයුම් හා සැපයුම් ජාල කළමනාකරණය **(Operations & Supply Chain Management)** යන විෂය ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයක් තෝරාගෙන ප්‍රගුණ කිරීමට අවස්ථාව සැලසේ.

කළමනාකරණය පිළිබඳ දැනුම සහ තොරතුරු තාක්ෂණ නිපුණතාව සහිත වෘත්තිකයනට ඇති ඉහළ ඉල්ලුම සැලකිල්ලට ගෙන ශ්‍රී ලාංකික සිසුනට නවීනතම අධ්‍යාපනයක් ලබාදීම සඳහා පර්යේෂණ, ව්‍යාපෘති සහ සය මසක සීමාවාසික පුහුණුව ද සහිතව මෙම පාඨමාලාව සකස් කර ඇත.

අපගේ දැක්ම හා එක්වීමට ඔබත් කැමතිනම් අපගේ අභියෝගතා පරීක්ෂණය සඳහා අයදුම් කල හැකිය. මෙහිදී පහත සඳහන් ලියකියවිලි නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම අවශ්‍යවේ.

අයදුම් කළ යුතු ආකාරය

1. අයදුම්පත් **www.mit.kln.ac.lk** වෙබ් අඩවියෙන් ද බාගත කළ හැකිය. එසේ බාගත කර ගත් අයදුම්පත් නියමිත පරිදි සම්පූර්ණ කොට පහත සඳහන් ලියකියවිලි ද සමග ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (විමසීම්:- 011-2914482)

2. අන්තර්ජාලය ඔස්සේ අයදුම්කරන ලද අයදුම්කරුවන් අදාළ අයදුම්පත සම්පූර්ණ කර එහි පිටපතක් හා සෑම ලේඛනයකම දකුණුපස ඉහළ කෙළවරේ අන්තර්ජාලය ඔස්සේ අයදුම් කිරීමේදී ලැබෙන යොමු අංකය සඳහන් කළ යුතුය. එසේම එම ලේඛන ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත්‍රය සමග පහත දැක්වෙන ලියකියවිලි අමුණා එවිය යුතුය.

1. මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින්, ගිණුම් අංක 055-1001-30667553 මහජන බැංකුව, කැලණිය ශාඛාවට රුපියල් දහසක් (රු.1000/-) බැර කරන ලද ලදුපත.
2. විදුහල්පති හෝ සාමදාන විනිශ්චයකාරවරයකු විසින් සිය නිල මුද්‍රාව තබා සහතික කරන ලද අ.පො,ස. (උ/පෙළ) 2019 "Z" අගය සහිත ප්‍රතිඵල ලේඛනයක්
3. ඉහත ලේඛනවල හා ඉල්ලුම් පත්‍රයේ තම නම සඳහන් වන ආකාරයේ වෙනසක් ඇතොත්, එකී වෙනස් නම් වලින් හැඳින්වෙන තැනැත්තා/ තැනැත්තිය එක් අයෙකු බව තහවුරු කෙරෙන දිවුරුම් ප්‍රකාශයක්

මෙම පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබීම අනිවාර්ය වේ.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 2.2.8.2 වගන්ති යටතේ වන පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කරන අයදුම්පතෙහි කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී පාඨමාලාවට ඉහළ ප්‍රමුඛතාවයක් ප්‍රකාශ කර තිබීම.
3. කර්මාන්ත පරිපාලන අධ්‍යයන අංශය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම.

යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

අ.පො.ස. (උසස් පෙළ) 2019 විභාගයේදී උසස් ගණිතය, සංයුක්ත ගණිතය, ගණිතය හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක් සඳහා සම්මාන (C) සාමාර්ථයක් සහිතව,

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයට ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් ඉදිරිපත්ව විෂයයන් තුනම සමත් වීම.

හෝ

2. ජෛවීය විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් දෙකක් සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය විෂයය සමත් වීම.

පහත දක්වා ඇති ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ පත්‍රයක සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ඉහත සඳහන් ලිපිනයට **2020 ජූලි 06 වන දිනට හෝ එදිනට පෙර** ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතු අතර අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලාව"** යනුවෙන් සඳහන් කළ යුතුය.

යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනය අදාළ අපේක්ෂකයන් වෙත පසුව දැනුම් දෙනු ලැබේ. පරීක්ෂණය පැවැත්වෙන මාධ්‍යය ඉංග්‍රීසි මාධ්‍යය වන අතර නිසිලෙස සම්පූර්ණ නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ලේඛකාධිකාරී,
කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
2020 ජූනි 08

UNIVERSITY OF KELANIYA, FACULTY OF SCIENCE. SRI LANKA

Aptitude Test

B.Sc. Honours in Management and Information Technology (MIT) Degree Progrmme 2019/2020

(Please fill in English using BLOCK letters)

1. Full Name of Candidate (Mr / Ms):
2. Surname of Candidate with Initials:
3. National ID No:
4. Permanent Address:
5. Telephone No.: Residence: - Mobile: -
6. E-mail Address: -
7. District in which the candidate sat for the G.C.E.(A/L) Examination 2019:
8. Results at the G. C. E. (A/L) Examination 2019:
   A/L Index No: Z - Score: ☐.☐☐☐

Subject	Grade	Subject	Grade
i. _____	____	iii. _____	____
ii. _____	____	iv. _____	____

9. G. C. E. (O/L) Examination: Year ☐☐☐☐
   Results for: Mathematics ☐ English ☐
10. Preference number for MIT (UGC Application): _____

I certify that the above particulars submitted by me are true and accurate.

……. ……
Date Signature of Applicant

Note:

i. Please ensure that you include (a) Deposit slip for Rs. 1,000/- (b) Certified result copies of G.C.E. (A/L) 2019, Z – Score and G.C.E. (O/L) (c) Affidavit, if documents carry a different name, in your application.

ii. Make sure you include your preference for the B.Sc. Honours in Management and Information Technology degree programme in your application for admission to the University Grants Commission.